**සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2011**

-----------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය ව්‍යාවනය**

----------------

මෙම වාර්තාවේ 1.2.4 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

----------------------------

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති 03 පරිදි විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම් භාර ගන්නා බවට ප්‍රකාශයක් මූල්‍යප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). i. සේවක පාර්තෝෂිත වෙන් කිරීම් ගණනය කිරීමේදී සේවා කාලය අඩුවෙන් හා වැඩියෙන් සැලකීම නිසා ප්‍රජා ශක්ති ඒකකයෙහි නිලධාරීන් පස්දෙනෙකු සඳහා රු. 56,500 ක ඌන ගණනයක්ද නිලධාරීන් 14 දෙනෙකු සඳහා රු. 114,000 ක අධිගණනයක්ද සිදු වී තිබුණි.

ii. 2012 වර්ෂයේ සේවයෙන් ඉවත් වූ නිලධාරියෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.63,750 ක පාර්තෝෂිත ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ). උපදේශක සේවා සපයන ආයතනයක වෙත 2011 දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු රු.379,104 ක ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.2.3 **ලැබිය යුතු ගිණුම්**

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

(අ) ඉන්දියානු ප්‍රජා සභාවෙන් "ලැබිය යුතු " ලෙස ගිණුමේ දක්වා ඇති රු. 90,577 ක මුදලක් 2008 වර්ෂයේ සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදී රු.1,723,450 ක වැය කර මිලදී ගත් ත්‍රී රෝද රථ 05, 7% ක පොලියක් සමඟ මාස 48 කින් අයකර ගැනීමේ පදනම මත 05 දෙනෙකු වෙත ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය ආවසානයට අයකර ගත යුතු රු. 1,111,267 කින් රු. 847,083 ක් අයකර ගත යුතුව තිබුණි.

(ඇ) 2009 වර්ෂයෙදී ස්වයං රැකියා සහ ව්‍යවසායකත්ව වැඩසටහන යටතේ පුද්ගලයන් 74 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු. 2,684,000 ක ණය මුදල වර්ෂ 3 කින් අයකර ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,404,150 ක වාරික හිඟ හිට තිබුණි.

(ඈ) අමාත්‍යාංශය විසින් පදනමේ සියලු වියදම් ප්‍රතිපූර්ණය කරන අතර, 2010 වර්ෂයේදී දරන ලද රු. 20,891,732 කින් රු. 8,150,154 ක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විස්තරය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i). | ගොඩනැගිලි - පිරිවැය | 234,440 | i. වටිනාකම් සමඟ එකඟ වන වත්කම් ලේඛනය<br>ii. භාණ්ඩ සමීක්ෂණ වාර්තා<br>iii. ස්ථාවර වත්කම් ලේඛණ |
| | ප්‍රජාශක්ති මධ්‍යස්ථාන ඉඩම් මැනීම - පොත් අගය | 1,518,238 | |
| | පරිගණක හා උපාංග - පිරිවැය | 28,780,867 | |
| | ලී බඩු හා උපකරණ- පිරිවැය | 18,568,360 | |
| | මෝටර් රථ- පිරිවැය | 6,557,901 | |
| | කාර්යාලී උපකරණ - පිරිවැය | 2,439,427 | |
| | වී- සෙට් උපකරණ - පිරිවැය | 25,381,877 | |
| | ජෙනරේටර් - පිරිවැය | 2,311,810 | |
| | ආයුධ හා උපකරණ - පිරිවැය | 3,352,670 | |
| | වෙනත් උපකරණ - පිරිවැය | 6,666,146 | |
| (ii). | ත්‍රීරෝද රථ ණය | 1,425,618 | වටිනාකම හා සැසඳෙන ණයගැති උපලේඛනය |
| (iii). | ක්ෂේත්‍ර චාරිකා සඳහා ඉන්ධන වියදම | 545,040 | i. ක්ෂේත්‍ර චාරිකා සඳහා ලැබුණු අනුමැතිය<br>ii. ක්ෂේත්‍ර චාරිකා වැඩසටහන<br>iii. ක්ෂේත්‍ර චාරිකා වාර්තා |
| (iv). | ණය හිමියෝ | 18,752,271 | ශේෂ සනාථ කිරීම් |

| | | | |
|---|---|---|---|
| (v). | තරුණ රැලියට සහභාගිවූවන්ට බෙදාදුන් හිස්වැසුම් හා ටී ෂර්ට් | 3,930,000 | i. පදනම වෙත භාර ගත් විස්තර<br>ii. සහභාගිවූ අයට බෙදාදුන් ආකාරය<br>iii. ඉතිරි ප්‍රමාණය |

### 1.2.5 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය | 2,391,544 | බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට පෙර ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ හා අදාල අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා නොගෙන කලමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් එම පහසුකම් ලබා ගෙන තිබුණි. |
| (ආ) | 1980 අංක 46 දරන සේවක භාරකාර අරමදල් පනතේ 16 වන වගන්තිය | 18,373 | සේවක භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කිරීම ප්‍රමාද වීම නිසා අධිභාර ගෙවීමට සිදු වී තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | මු.රෙ 371(2) | 318,867 | අදාල කාර්යය නිම කළ විගසම අත්තිකාරම් මුදල පියවිය යුතු වුවත්, 2010 වර්ෂයේ නිලධාරියෙකුට ලබා දී තිබුණු අත්තිකාරමක් සමාලෝචිත වර්ෂයෙදීද පියවා නොතිබුණි. |
| | මු.රෙ.371(2) (ආ) | 50,000 | රු.20,000 කට වැඩියෙන් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය නොහැකි වුවද ඊට පටහැනිව නිලධාරීන් දෙදෙනෙකුට අත්තිකාරම් ලබාදී තිබුණි. |
| | මු. රෙ. 750 | | පදනමේ සියලුම අංශ ආවරණය වන පරිදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අංක 22/99 හා 1999 ඔක්තෝබර් 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.1.6 ඡේදය | - | (i) අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට රාජකාරි කටයුතු හා කාර්යාලයේ සිට නිවස දක්වා යාම් ඊම් සඳහා නිලවාහන අනුයුක්ත කළ හැකි බව දන්වා තිබුණද පදනමේ නිලධාරීන් 5 දෙනෙකු වෙත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව උක්ත කාර්යයන් සඳහා වාහන අනුයුක්ත කර තිබුණි.<br><br>(ii) පෞද්ගලික වාහන රාජකාරි කටයුතු සඳහා පාවිච්චි කිරීම සඳහා හිමිකමක් නොමැති නිලධාරියෙකුට පෞද්ගලික වාහනයක් රාජකාරි කටයුතු සඳහා පාවිච්චි කිරීම වෙනුවෙන් ප්‍රවාහන දීමනාව ලෙස රු.589,425 ක් ලබා දී තිබුණි. |
| (ඉ) | අංක පීඊඩී 50 හා 2008 ජූලි 28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 ඡේදය | 765,435 | චක්‍රලේඛයේ සඳහන් ඉන්ධන සීමාව ඉක්මවා නිලධාරීන් 4 දෙනෙකු වෙත ඉන්ධන දීමනා ලබා දී තිබුණි. |
| (ඊ) | අංක 30 හා 2006 සැප්තැම්බර් 22 දිනැති කලමනාකරණ සේවා චක්‍රලේඛය | | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්ය පරිපාටිය සංශෝධනය කර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි. |
| (උ) | අංක IAI/2002/02 හා 2002 දෙසැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | | චක්‍රලේඛ ප්‍රකාරව පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 38,064,921 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,511,530 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.26,553,391 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ආදායම රු.10,174,181 ක් අඩු වීම සහ වියදම රු.16,379,210 ක වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ විවිධ අදියරයන් පහත දැක්වේ.

| | 2011.12.31 | 2010.12.31 | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වාර්ෂික ක්ෂය හා හිලව් වියදම් ගැලපීමට පෙර ලාභය | 1,525,649 | 11,325,203 | 9,799,554 |
| වාර්ෂික ක්ෂය හා හිලව් වියදම් ප්‍රමාණය | 39,590,570 | 22,836,733 | 16,753,837 |
| වාර්ෂික ක්ෂය හා හා හිලව් වියදම් ගැලපූ පසු පාඩුව | (38,064,921) | (11,511,530) | 26,553,391 |

### 2.3 ප්‍රාග්ධන බාදන අවස්ථාවන්

------------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයේදී සමුච්චිත අරමුදලේ බැර ශේෂය රු. 40,237,761 ක්ව තිබූ අතර වර්ෂයේ අලාභය වූ රු.38,064,921ක් හා රු. 4,109,838ක්වූ පෙර වර්ෂ ගැලපුමක් , ගැලපීමෙන් පසු වර්ෂය අවසානයේ සමුච්චිත අරමුදල රු. 1,936,998 ක හර ශේෂයක් බවට පත්වී තිබුණි.

### 2.4 මතභේදයට තුඩුදෙන ගණදෙනු

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශ වියදම් රු. 7,626,342 ක් පදනම විසින් දරා තිබුණු අතර පසුගිය වර්ෂයේ වියදම්ද ඇතුළුව රු. 4,112,753 ක් තවදුරටත් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කළ යුතුව තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ලබාගෙන තිබුණු කුලී ගොඩනැගිල්ලක් සඳහා පදනම විසින් 2009 වර්ෂයේදී දරනලද රු.3,227,524 ක අලුත්වැඩියා වියදම එම වර්ෂයේද

ඇතුළුව ඉදිරි වර්ෂ හතරකින් පදනමේ ලාභයට එරෙහිව කපාහැරීමට තීරණය කර තිබුණු අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව රු.806,881ක් කපා හැර තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

ප්‍රජාශක්ති මධ්‍යස්ථාන පිහිටුවා ඇති ඉඩම් පදනමට පවරා ගැනීම සඳහා 2007 වර්ෂයේ අදාල ඉඩම් මැනීම සඳහා රු.1,518,238 ක් සහ සමාලෝචිත වර්ෂයේදී රු.704,410 ක වැය කර තිබුණි. වැය වූ රු.2,222,648 ක මුළු වියදම ප්‍රාග්ධනත කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම ඉඩම් පදනමට පවරා ගෙන නොතිබුණි.

**3.2. නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පදනම සතුව ඇති රු.398,989 ක් වටිනා සිහිවටන පලගන තොගය 2006 වර්ෂයේ සිට 2012 සැප්තැම්බර් දක්වා භාවිතයට නොගෙන ගබඩා කර තිබුණ.

**3.3. කාර්ය මණ්ඩලය**

-------------------

2005 ජූනි 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 3 අනුව පදනම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කර ගත යුතු වුවද, 2008 වර්ෂයේ සිට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කර නොතිබුණි.

**04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

අංක පීඊඩී 12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පදනම විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 4 ක් ප්‍රමාද වී 2012 ජූලි 02 දින ඉදිරිපත් කර තිබුණි.

**4.2 සංයුක්ත සැලැස්ම**

---------------------

අංක පීඊඩී 12 හා 2003 ජූන 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.3 **ක්‍රියාකාර සැලැස්ම**

---------------------

සංයුක්ත සැලැස්මේ ඇතුලත් දෑ ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.4 **අභ්‍යන්තර විගණනය**

---------------------

රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී පදනම සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.5 **විගණන හා කළමණාකරන කමිටු**

-----------------------------------

අංක පීඊඩී 12 හා 2008 ජූනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛයට ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටු පිහිටුවා නොතිබුණි.

4.6 **ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පදනම විසින් සකස් කර නොතිබුණි.

4.7 **අයවැය පාලනය**

------------------

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

(අ) සමස්ත ආයතනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු හෙයින් අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයන් ලෙස යොදා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් පදනමේ වියදම් ප්‍රතිපූර්ණය කිරීමට ප්‍රමාද වීම නිසා මූල්‍ය අවශ්‍යතාවය සඳහා පදනම විසින් නිලධාරියෙකුගෙන් හා ගරු අමාත්‍යවරයාගෙන් කෙටිකාලීන ණය ලෙස පිළිවෙලින් රු.200,000 හා රු.1,100,000 ක් ලබාගෙන නැවත පියවා තිබුණි.

4.8 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

--------------------------------

පදනම විසින් කිසිදු වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 05. පද්ධති හා පාලනය

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳ වරින්වර පදනමේ සභාපති වරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) මූල්‍ය ප්‍රකාශන

(ආ) අයවැය පාලනය

(ඇ) අරමුදල් උපයෝජනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) වත්කම් පරිපාලනය

(ඊ) ණය අයකර ගැනීම

(උ) ලැබිය යුතු ගිණුම්